පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2016

-----------------------------------------------------------------------------------------------------

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ පනවන ලද 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග අංක 06 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අරමුදලේ ක්‍රියාකාරීත්වය

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 14 වගන්තියට අනුව හා මුල් ප්‍රඥප්තියේ 16 (අ) (2) (1) ලෙස ඇතුළත් වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් පනත සංශෝධනය කිරීමකින් තොරව 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2011 ජනවාරි 01 දින සිට අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනුවල භාරකාරත්වය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

## 1.5 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 ට අනුකූලව උපචිත පදනමට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොළී ආදායම රු. 2,895,992 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 2,806,049 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 89,943 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු ගිණුම හරහා ගනුදෙනු සිදු කර තිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 58,294,523 ක් වූ විශ්‍රාම වැටුප් වියදම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,335,565 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 209,924,558 ක් වූයෙන්, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 188,588,993 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද 2.2.2 ඡේදයේ දක්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු මත මෙම මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් වෙනස් නොවනු ඇතැයි යන්න බැහැර කළ නොහැකි විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 16(අ) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු ඉන් ඉටු වී නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

මාසිකව විශ්‍රාම වැටුප් වියදමේ විචලනයන් සිදු වී තිබුණද එම ප්‍රමාණයන් මූල්‍යමය වශයෙන් හඳුනාගනිමින් එම විචලනයන් තහවුරු කර ගැනීම සඳහා සැසඳීම් ලේඛනයක් සකස් කර නොතිබුණි. විශ්‍රාම වැටුපට හිමිකම් කියන විශ්‍රාමිකයින්ගේ යාවත්කාලීන කළ නාම ලේඛනයක්ද අරමුදල සතුව නොතිබුණි. එහෙයින් විශ්‍රාමිකයින් මියගිය විට ඒ සඳහා කළ යුතු ගැලපුම් කාර්යක්ෂමව සිදුනොවීම නිසා ද්විත්ව ගෙවීම් සිදු නොවන්නේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදල සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | විශ්‍රාම වැටුප් ගෙවීම | - ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු කැඳවා අරමුදලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වා නොතිබීම. |